Page 6 Aug-Sep 2012.qxd 24/09/2012 13:22 Page 1



# නිර්මාණ Nirmana

## සසුන් අඹරේ ගුරු තරුව


සසුනඹරේ ගුරු තරුවයි විදු සාර
සිල්වත් බවින් තෙවලා දහමින් සාර
කුරවී හඬින් දම්දෙසුවේ දී මිහිර
නාහිමිසඳ ඔබයි මේධා ලංකාර

අපිස් ගුණෙන් සහ ගුණයෙන් පිරි පුන්‍ය
උජුපටිපන්න දුටුවන්හට සුප සන්‍ය
සහ පරපුරේ පෙරමග වැඩි හිමි යන්‍ය
මිහිරිගමට මුලු ලකටම ඔබ රන්‍ය

අනූ වසක් උර රැඳි අරහත් ධජය
දෙවන සියවසේ ලෝ වැඩු පින් කඳය
පන්හිඳ කවිය ඔබ ගුණ වැනුමට මදිය
පරසතු මල් පිදේ මග නාහිමි වැඩිය

අඹගහවත්ත සහ පරපුර කර සොබන
දිරිමත් කලා යායුතු මග නොවරදින
නිවනක් ඇතත් නොදුරකි ඔබ හට කලන
නැවතත් වඩිනු මැන ලක්පොලවට මෙතින

♦ **අසංක දිසානායක** London



## අන්සතු ළඳක් දෙස නොබලන් වපර ඇසින්

කරනම් ගසා අහසින් අඹ ගහට නැග
දළු කොළ කඩා තුඩගින් ඇන කරන දහ
රැකවල් කරන් හිටියත් යන අතර මග
නුඹ දන්නවා මා අන්සතු ළඳක වග

ඔහු මේ කැදැල්ලට මා අරගෙන ආවේ
ගිය පෝ දිනයි මොරසූරන වරු සාවේ
මට ඔහු තමා ඔහුටද ඇති සැප මාවේ
අප එක් සිතින් මයි එක සෙවනට වූවේ

අඩවන් නෙතින් බැල්මෙන් ඉඟිකරන විදී
මගෙ හිත නමාගන්නට දැරු වෙහෙස මදී
යන එක හොඳයි අකුලාගෙන දහර පොදී
ඔහු ආවොතින් නුඹෙ අත්තටු දෙකම සිදී

ගැයුවත් නුරා ගී කියමින් නෙක තාල
බැලුවත් හොරෙන් අඩ බැල්මෙන් මන මාල
රැඟුවත් කොතෙක් රැඟුමන් කරමින් ලීල
මමවත් මගේ හදවත නැත ඔට ලෝල

තටු විහිදුවා අත්තෙන් අත්තකට ගිහින්
මගෙ ගෙට එබෙන්නේ දල්වා දෙනෙත සිහින්
කොන්කර දමයි නුඹ දවසක නුඹගෙ රැහින්
අන්සතු ළඳක් දෙස නොබලන් වපර ඇහින්

හොට ලස්සනයි කර මාලය රතට රතයි
ගත ලස්සනයි දිළිසෙන කොළ පැහැය ඇතැයි
ගති ලස්සනයි නැත්තේ හැම දෙනම හිතයි
අවලස්සනයි නුඹෙ හැම සිතුවිලිද කැතයි

පලවැල අරන් එන හිමි දැන් ළඟම ඇතී
පල නැත කොතෙක් හිටියත් වටපිටම එතී
පලවා හරින්නට පෙර හිත සැකය හිතී
පලයන් මාලගිරවෝ හුරතලය ඇතී

පරඬැල් සොයාගෙන ගොස් සෙවනැති තැනක
හැදුවත් කැදැල්ලක් තුරු මුදුණේ බෙණක
සිත සන්තොසින් ඉන්නට නුඹටත් දිනක
හමුවෙයි කුරුළු කෙල්ලක් පැහැබර කණක

♦ **රත්නා ලංකා අබේවික්‍රම**
Sri Lanka

*කවියට කලාවට නිති අත හිත දෙන්ට*
*මෙම කවි පිටුව වෙන්වෙයි පාඨක යින්ට*
*සිතුවිලි ලියා හැකි පමණින් කෙටි වෙන්ට*
*අප වෙත එවනු මැන කාටත් කිය වන්ට*

## මව්පියන් - දරුවන්

කඳු ලෙන් ලේ කිරෙන් සෙනෙහෙන් ඉපිල යන
හැදූ වැඩූ දෙමින් ගරුහැරුකම් සියලු දින
පි දු මට මෙන්මැ වැළුමට මතුකරන පින
බු දු ගුණ සේය මව්පිය දෙදෙනෙකුගෙ ගුණ

සිව් මහ නිදන් ගෙන තැබුවත් දෙපය ළඟ
මව් පිය සෙනෙහසට මිළකළ නොහැකි වග
කවු රුත් හිතනු දරුවනි දැක දැහැමි මග
සව් කෙලෙසුන් නසන පින ඇත සසර අග

සිත් දැන දුකට සැපතට නිරතුරු ලන්ව
වත් පිළිවෙත් වලින් බොදු විරු සිහ ලුන්ව
උත් තම දෙගුරුන්ව උත්තම දරු වන්ව
අ ත් වැල් බැඳගන්න මෙත් සිත් පිරි පුන්ව

♦ **කිව්පති පාතකඩ කුලතිලක**
මහරගම Sri Lanka

## from Salalihini Sandeshaya of Ven. Thotagamuve Sri Rahula Thera
## තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන්ගේ සැළලිහිණි සංදේශයෙන්

සමනොළ මුහුල මහ සමුදුර මෙවුල් බර
සු ල ක ළ පුවළ ලකඟන සිරි යොවුන් වර
තර කළ විසල් වාසල් යතුරු මෙ නුවර
බැඳ හළ රුවන් තනපට කියලිය පවුර

සමනොළ කන්ද යනු ලංකාංගනාව බැඳ ගැටගසා ඇති කෙස්වැටියයි. මහා සමුද්‍රය ඇය හිණවටා බැඳ ඇති මේඛලාදාමය හෙවත් අලංකාර බඳපටියක් සේ පෙනෙයි. නුවර ආරක්ෂාවන සේ තනවා ඇති ගේට්ටුවක් සහිත මහා පවුර ලකඟන තරුණ වියේදී බැඳ ඉවත දැමූ රනින් කළ තනපටක් වැනිය. !

Samanola muhula maha samudura mevul bara
Sulakala puwala lakangana siri yovun vara
Thara kala visal waasal yathuru menuwara
Benda hala ruwan thanapata kiyaliya pavra

The rampart round the city is like a golden band with the large city gate as its buckle, worn in her youth by the beautiful maiden Lanka, whose knot of hair is Adam's Peak (Mount Samanala) and whose waist band is the mighty ocean.

## අප හැර ගිය හිතවතාට !

ප්‍රංශය වෙතට පැමිණියෙ ඔබ කැළණි පුරෙන්
ඔබ අප හමුවුණේ සුහදව පැරිසි යෙන්
නිති හමුවුණේ නැත රස මසවුළු සම ගින්
දුටු තැන නමුත් ලැබුණේ මුව සිනහ දසුන්

ගෙවූ මුත් දිවිය බාධක මැද යුරෝප යේ
මැසිවිලි නැගුවෙ නම් නැත ඔබ ජීවිත යේ
සුමිතුරු සංවාද රැකියා දිවා රැයේ
ඉටු කළ බව දනිමු යුතුකම් විරාම යේ

වියපත් වීම ලෙඩ දුක් ෂතහට උරුම යි
අප දත් බුදු දහම එය මොනවට පෙන්ව යි
සිරිලංකාව හැර යළි ඔබ නොඑන බව යි
ලබැදි සොයුර ඔබ හට අම නිවන් සුව යි!

*ජුනි 11 වන දා ශ්‍රීලංකාවේ නිවාඩු ගතකරමින් සිටිය දී හදිසියේ වියෝවුණු පැරිසියේ විසූ අප සහෘද සුනිල් බණ්ඩාරයන් වෙනුවෙනි.*

♦ **සන්ධ්‍යා කුමාරගේ**
Paris France

## අපේ අත්තම්මා

සුළඟ හමනවා -ගස්වල කොළ ගැළවෙනවා
මිදුලෙ පිරෙනවා - වදුලක් වගේ පෙනෙනවා

අත්තම්මා පාන්දරින් මිදුලට යනවා
ඉදල අරන් මිදුල පුරා ඇය ඇවිදිනවා
ඇවිද ඇවිද ඉදලින් වැලිකැට පිසලනවා
වදුළ වගේ පෙනුණු මිදුල කළඑළි වෙනවා

මිදුල ඇමද අත්තම්මා අත සෝදන්නේ
සුවඳ කූරු කුප්පිය වට්ටියෙන් බහින්නේ
රුක්අත්තන සමන් පිච්ච මල් ඇතිරෙන්නේ
බුදු කූඩුවෙ බුදු පිළිමෙට එළිය වැටන්නේ

හැමදාමත් අත්තම්මා මිදුලට යනවා
ඉදල අතට ගෙන මිදුලේ රටා මවනවා
ගේ ඉදිරියෙ බුදුගෙයි මල් පහන් පිදෙනවා
අත්තම්මා පහන් සිතින් බුදුන් වඳිනවා

♦ **මාලපල්ලේ**
**කුමුදු රොහාන් අමරසිංහ**
Edmonton, London

## වළාරොද සහ දියබිඳ

**ඇය -**

දනිමි ඔබ වළාවකි
අනන්තයෙ තුනීවුණු
කිසිවිටෙක එක තැනක
රැඳෙන්නට නොම සිතුණු
පිරි දිය බිඳුවක්ව
ඔබට රහසේ බැඳුණු
අවසර ද සරන්නට
විසල් ලොව ඔබ රැඳුණු

**ඔහු -**

මගෙ සෙවණ පතයි තව
තවත් දිය බිඳු පොකුරු
ගොනු නොවෙමි පැතිර යමි
නොහිමි අහසක සොඳුරු
වැස්ස වී ලැගුම් හැර
මගෙන් නික්මෙනා තුරු
සිහිලසින් වෙළෙන්නම්
ලොවට නොදැනෙනා යුරු

♦ **උදේනි සිරිමාන්න**
පිළියන්දල Sri Lanka

## හිනැහෙන්න සඳවතියේ !

ඔබ දෙනෙත් කවුළුවෙන්
උතුරා ගැලූ කරුණා සිසිලස
හදවතින් දනන් හට
පෑ සෙනෙහසේ මෙත් සිසිල
පිනට, දනට දෑත දිගු කළ
සෙනෙහෙබර සොයුරියේ,
වූවා ඔබ අපට සඳවත !

සිතා ගන්නට දරාගන්නට බෑ
කුරිරු වූයේ ඇයිද මෙතරම්
දෛවයේ සරදම....
පවුකාර වීද අප
රෝහලේ ඇඳක් මත
ශාන්තව නිසල ලෙස
සිටින ඔබ දකින්නට....

ඇසේ ගුණ ගායනා
නිරන්තරයෙන්
ඔබ වටා සිටින ඔබේ
ළබැඳියන්ගේ මුවින්.....
සඳවතියේ නොඇසේද ඔබට එය
සිටින්නේ නෙත් මුවන් වසා
නොසොල්වා - නොසෙල්වී....

දෙකන්වල අගුල්පත් විවරකර
සඳවතියේ.....
හිනැහෙන්න අප හා එක්ව
වෙනදා ලෙසින්
ඔබ නුවන් තලාවේ
සිනහ මල් පුබුදලා.......!

♦ **මොරින් සී. පෙරේරා**
London W11

## අසිරිය

වැහි සුළං කෝඩය
දරා ඉවසමින්
බිම බලන් හිඳිනා
රෝස කැකුලකි

හඬනවාදැයි
හිනැහෙනවාදැයි
කාටවත් නොතේරේ

♦ **එරංගා පෙරේරා**
Netherlands

## සිතක මතක


වරෙක සිත අවදිවී පෙරලමින් මතක පොත
සිතුම් සමුදුරු වෙරළ වෙතට යයි නොදැනීම
බිඳෙන රළ නගන හඬ කරයි මතකය අවදි
ගෙනයමින් සිත සිතිජ මාවතට නොනැවතී

හමුවූ දින එක්වූ දින වියෝවන් එහි ඇතේ
කියූ කතා නැගූ සිනා නැවුම් වී යළි ඇසේ

වසර ගණනක් පැරණි මතකයන් අළුත් වී
හිත මිතුරු නෑසියන් තතු සිතට එයි ඇදී

සිදී නැති මතකයන් අළුත්කර දෙන සිතක්
ඇති තුරා තරුණ වෙමි දිනපතා මම සිතින්

♦ **සුනිල් පෙරේරා**
Skegness
Lincolnshire UK



## පන්දු හරඹ

බෙදී දෙපිලකට දෙපිරිස් පිටිය මැද
සැදී පැහැද සටනට වන් සෙබළු ලෙද
හු දී ජනයනගෙ නෙත සිත එකට බැඳ
ව දී පොරට පෙන්වා පන්දුවක තෙද

මොලවා මිටෙන් පහරක් පන්දුවට ඇන
ග ළ වා ගෙන එකෙක් එය තව එකෙකු ගෙන
එ ළ වා එන්නවුන් හැර වෙනතකට පැන
ප ළ වා හරියි තවකෙකු ඉදිරියට එන

නවා කරකවා දෙඅතද සමග දෙපා
ය වා පන්දු එකිනෙක වෙර විරිය පපා
ද වා ලන්ට හැදූ විට ගත වෙහෙස නොපා
ම වා පෙන්නවයි පිත්තෙන් නොයෙක උපා

දෙපයට වරය දී පන්දුව රැගෙන යතී
එය දැක අයෙක් මග අවුරාලන්ට එතී
ජයගෙන එක් පිලක් ඔල්වරසන් නගතී
පැරදුණ අනෙක් පිළ හිස අත් බැඳ තැවෙතී

ද කි ත ත් කෙනෙකු තුළ ඇතිවන ලතැවීම
නොමදත් තවුන් විලසට ජයගොස පැම
මි නි ස ත් කමට පටහැනි මෙම හැසිරීම
දැ ක ග ත් හැකි තැනක් වෙද මෙතැනදී සේම

♦ **සේපාලිකා ජයසිංහ** Sri Lanka

## සැමදා සිටිමි ඔබෙ මතකය තුරුළුකොට

සිව් වසරක් ගෙවුණේ අප තනි කරලා
සංවේගය දැනුණේ ලය සිර කරලා
හංගාගෙන සිටියත් සිත දැඩි කරලා
කඳුළු බිඳක් වැටුණේ මව සිහි කරලා

මුනිවත නැතේ හඬ සවනෙහි රැඳුණ නිසා
ඔවදන ඇසේ නිති සිහියට නැගෙන නිසා
වත මට පෙනේ නෙත් අග එය නෙළුව නිසා
සෙනෙහස නොම දැනේ දැන් ළඟ නොමැති නිසා

අවසන් වදන් ඇසුණේ මට දුර කතනින්
සිහිනෙන් තවත් මුමුණයි ළඟ මගෙ දෙසවන්
නොඇසෙන වගක් දැනුනම යළි එම වදනන්
සැණෙකින් විදුලි සැරයක් යයි හද දෙදරන්

මැසිවිලි අසනන්ට අද නැත ඒ සවන
සරදම් වාද වෙන්නට නැත ඒ වදන
සැනසිලි පහස ගෙන දෙන්නට ඒ පවන
නැත අද මවුනි අපහට නැත ඔබෙ සරණ

හැරදා ගියේ බැමි බිඳිලා නොඑන් නට
පෙරදා පැතූ ලෙස සසරෙන් මිදෙන් නට
නැමදා පතමි මව් නිවනෙහි රැඳෙන් නට
සැමදා සිටිමි ඔබෙ මතකය තුරුල් කොට

♦ **ලක්ෂමි පෙරේරා**
Carshalton Surrey UK

## පැතුම

බෝපත් සිසිලක බෝ සුව විඳිනට
ඇළක දොළක වැතිරී
නැහැවෙන්නට
සල් සපු නාමල් සුවඳ සිඹින්නට
කෙදිනකදෝ ගම් පියසට යන්නේ

අහස උසට නැගි මාළිග තිබුණට
පාර පුරා නෙක වාහන දිව්වට
වසත් සමේ ගහ කොළ දළු ලෑවට
ගමේ සිරිය සුන්දර බව කොයිබද

සුදුහම ඇති නැති දෙපිරිස මැද්දේ
නිල් රතු කොළ බෝ
ඉතිරී යන්නේ
හිත පාරවනා තනිකම බිඳ දා
කෙදිනකදෝ ගම් පියසට යන්නේ !

♦ **ධම්මි විජේසිංහ**
Toronto Canada